**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**

**රත්නපුර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 05 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 සැප්තැම්බර් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 නොවැම්බර් 25 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට සභාව සතු ස්ථිර තැන්පතු ආයෝජන වටිනාකම රු. 2,030,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එම අගය රු. 2,000,000 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 30,000 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.

(ආ) අවිස්සාවේල්ල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ආයෝජනය කර තිබූ රු. 1,000,000 ක ස්ථිර තැන්පතුව 2012 දෙසැම්බර් 10 දින මුදල් කර ගැනීමේදී ඒ සඳහා ලැබී තිබූ රු. 30,000 ක පොලී මුදල වර්ෂයේ පොලී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) වෙළඳ බලපත්‍ර සහ ව්‍යාපාර බදු ගිණුම් වලට අදාල තථ්‍ය ලැබීම් උපයෝගී ලේඛන අනුව සැසඳීමේදී රු. 56,480 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂයට ස්ථිර තැන්පත් සඳහා ලැබිය යුතු පොලී මුදල රු. 95,275 ක් වුවද, අවසන් ගිණුම් වල එම අගය රු. 200,721 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 105,446 ක් පොලී ආදායම් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඉ) උසාවි දඩ ගිණුමේ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය රු. 2,191,290 ක් වූ අතර, ඉකුත් වර්ෂ වලට අදාලව ලැබී තිබූ මුදල රු. 4,451,381 ක් වූයෙන් රු. 2,260,091 ක් වූ වෙනස උසාවි දඩ ගිණුමෙන් සමුච්චිත අරමුදලට බැර කල යුතු වුවද එම ගැලපීම් සිදු කර නොතිබුණි. එසේම වර්ෂය සඳහා බිල්කල රු. 2,500,000 ක මුදලින් කිසිඳු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ලැබී නොතිබූ අතර, ඉහත දක්වන ලද ගැලපීම සිදු නොකිරීමෙන් උසාවි දඩ ගිණුමේ අවසාන ශේෂය රු. 239,909 ක් වී තිබූ අතර, මේ අනුව අවසාන ශේෂය රු. 2,260,091 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) ගිණුම් විෂයයන් 04 කට අදාල 2012 දෙසැම්බර් 31 දිනට පාලන ගිණුම් අනුව ශේෂ එකතුව හා උපයෝගී ලේඛන අනුව ශේෂ එකතුව අතර, රු. 178,291 ක වෙනසක් නිරීක්ෂණය විය.

(උ) මුද්දර ගාස්තු ලේඛනය අනුව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ මුදල රු. 8,522,218 ක් වුවද ගිණුමේ එම අගය රු. 8,494,618 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු. 27,600 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඌ) 2010 වර්ෂයේ සිට දේශීය ණය හා සංවර්ධන අරමුදලින් වාරික වශයෙන් ලබා ගෙන තිබූ මුළු ණය මුදල රු. 12,962,806 කි. මෙම ණය මුදල ශේෂ පත්‍රයේ ණය ප්‍රාග්ධනය ලෙස පෙන්වා නොතිබූ අතර, එම ණය මුදලින් ගොඩනගන ලද වත්කම් වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. තවද ඉහත ණය මුදලට අදාලව බැංකු ගිණුමේ ඉතිරිව තිබූ රු. 164,842 ක් වූ මුදල ණය ප්‍රාග්ධනය ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ උක්ත ණය මුදල සඳහා වන පොලිය වූ රු. 623,488 ක් අදාල වැය ශීර්ෂයන්ට හර කර නොතිබූ අතර, ගෙවීම් නොකරන ලද එම මුදල ජංගම වගකීම් යටතේ ද දක්වා නොතිබුණි.

(එ) අවස්ථා 10 කට අදාල සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා ණයහිමියන් යටතේ රු. 93,679 ක් වෙන් කිරීම් සිදු කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ වියදම හා වර්ෂාවසාන ණයහිමි ශේෂය එකී වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 7,091,624 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1. මූල්‍ය ප්‍රතිපල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ත වියදම ඉක්ම වූ ආදායම රු. 164,609 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 1,004,452 ක් විය.

### 2.2. මූල්‍ය පාලනය

(අ) 2012 ජූලි මස සිට මුදල් පොතේ අයිරාවක් ඇතිවන පරිදි චෙක්පත් ලියා තිබූ අතර, 2012 දෙසැම්බර් 31 දිනට බැර ශේෂය රු. 1,017,536 ක් විය. නිකුත් කල නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ මාස 06 ක කාලයක් ඉක්මවන ලද චෙක්පත් 66 ක වටිනාකම රු. 376,858 ක් වූ අතර ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 395(ඈ) ප්‍රකාරව කටයුතු කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) ආයතනයේ අනියම් සහ කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින සේවකයන්ගේ වැටුප් ගෙවීමට ප්‍රමාණවත් මුදල් නොතිබීම හේතුවෙන් අවිස්සාවේල්ල ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අංක 2-0057-01-43731 දරන රු. 1,000,000 ක ස්ථිර තැන්පතුව ආපසු ලබා ගෙන ඉන් රු. 500,000 ක් මේ සඳහා උපයෝගී කර තිබුණි. මෙම ස්ථිර තැන්පතුව 12% ක පොලී අනුපාතයක් යටතේ 2013 ජූනි 09 දින කල්පිරීමට නියමිතව තිබූ අතර, මාස 06 කට පෙර ආපසු ගැනීමේදී රු. 30,000 ක පොලී මුදලක් පමණක් ලැබී තිබූ අතර, මේ අනුව රු. 90,000 ක පමණ පොලී මුදලක් ආයතනයට අහිමි වී තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 7,954 | 3,721 | 5,031 |
| (ii.) | බදු කුලී | 4,485 | 3,601 | 862 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 1,057 | 746 | 75 |
| (iv.) | වෙනත් ආදායම් | 6,714 | 561 | - |

2.3.2 බදු කුලී

ප්‍රාදේශිය සභාවට අයත් පොදු වෙළඳසැල කඩකාමර සඳහා නිසි පරිදි කුලී මුදල් නොගවීම මත සභාව මගින් නඩු අංක 24577 ආර්.ඊ. යටතේ කඩකාමර වෙනුවෙන් නඩු පවරා තිබූ අතර, ඒ අනුව 2007 අප්‍රේල් 01 සිට 2008 ඔක්තෝබර් 30 දක්වා අංක 15 දරන කඩකාමරය සඳහා හිඟ කුලිය වූ රු. 69,750 ක මුදල අයකර ගැනීමට පවරන ලද නඩුවේ තීන්දුව අනුව වාරික 10 කින් ගෙවා නිම කල යුතු බවට තීන්දු කර තිබූ නමුත් විගණිත දිනය වූ 2012 නොවැම්බර් 06 දින වන විටත් ඉහත මුදලින් රු. 23,011 ක මුදලක් ගෙවීමට කටයුතු කර නොතිබූ අතර, හිඟ මුදල් අය කර ගැනීම සඳහා නැවත අධිකරණය වෙත වාර්තා කිරීම හෝ සිදු කර නොතිබුණි.

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 239,909 |
| (ii.) | මුද්දර ගාස්තු | 2,500,000 |

2.3.4 බලපත්‍ර ගාස්තු

සභා බල ප්‍රදේශය තුල පවත්වා ගෙන යන ව්‍යාපාර හා කර්මාන්ත සම්බන්ධයෙන් සමීක්ෂණය කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් පිළියෙල කර තිබුණද විගණිත දිනය වූ 2012 නොවැම්බර් 06 දින දක්වාම 2012 වර්ෂය සඳහා බලපත්‍ර ලබා දීම ඉතා පහල මට්ටමක පැවතුණි. ලේඛනය අනුව කර්මාන්ත 613 ක් සඳහා වෙළඳ බලපත්‍ර ලබා දී නොතිබූ අතර, අයකර ගත යුතු රු. 227,325 ක බලපත්‍ර ගාස්තුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.4 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) හා 132 වගන්තිය ප්‍රකාරව යම් ආගමික, පුණ්‍ය, සංස්කෘතික, සෞඛ්‍ය, විනෝදාත්මක, අධ්‍යාපනික හෝ සුභසාධක කටයුතු සඳහා වර්ෂයකට එකතුව රු. 1,000 ඉක්මවන වියදම් සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් සභාව විසින් රු. 1,668,905 ක වටිනාකමැති පහත සඳහන් ආධාර සඳහා එසේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

| | |
|---|---|
| සිවිලිම් තහඩු | 556,200 |
| මුළුතැන්ගෙයි උපකරණ | 223,600 |
| වෙනත් | 889,105 |
| | --------------- |
| | 1,668,905 |
| | ======== |

2.5 අවිධිමත් ගනුදෙනු

(අ) නිසි පරිදි විවෘත මිල ගණන් කැඳවීම් කර හෝ ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීම් නොකර 2012 වර්ෂය තුල අවස්ථා 02 කදී පුද්ගලික ආයතනයක් වෙතින් රු. 749,700 ක් වැය කර පුටු 980 ක් මිලදී ගෙන තිබුණි.

(ආ) 2012 අයවැය ප්‍රතිපාදන යටතේ සභා බල ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන වලට සුභසාධන වියදම් දැරීමට වැය ශීර්ෂ යටතේ ප්‍රතිපාදන අවසන් වූ පසු 2012 නොවැම්බර් මස වන විටත් ප්‍රතිපාදන ඉක්මවා රු. 5,606,668 ක වියදමක් දරා තිබුණි.

(ඇ) වරිපනම් ලේඛන යාවත්කාලීන කිරීම වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවකයින් දෙදෙනෙකු බඳවා ගෙන 2011 සැප්තැම්බර් 09 දින සිට එකතුව රු. 182,550 ක් වූ දෛනික වැටුප් ගෙවා තිබුණි. පළාත් පාලන කොමසාරිස්ගේ 2012 ඔක්තෝබර් 04 දිනැති අංක CLG 333R දරන ලිපියට අනුව මෙම කාර්යය, කළමනාකරණ සහකාර හෝ වැඩසටහන් සහකාර නිළධාරීන් යොදවා ඉටු කර ගත යුතු රාජකාරියක් බැවින් සේවා ගිවිසුම් මත කම්කරුවන් යොදා මෙම රාජකාරිය ඉටු කිරීම සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බව දක්වා තිබුණත් ඊට පටහැනිව සේවකයින් සේවයේ යොදවා දෛනික වැටුප් ගෙවා තිබුණි.

(ඈ) 2012 මැයි 29 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක 03/2012 දරන චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව මහජන නියෝජිතයා සතුව වාහනයක් පවතින බවට තහවුරු කර ගැනීමකින් තොරව මහජන නියෝජිතයින් දෙදෙනෙකු සඳහා රු. 30,000 ක් ඉන්ධන දීමනාවක් ගෙවා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදි රු.1,012,925 ක් වූ වටිනාකමට භාණ්ඩ ද්‍රව්‍ය බෙදා දී තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මන්ත්‍රී යෝජනා සභාගත කර නොතිබුණි.

(ආ) ප්‍රමුඛතා ලැයිස්තුවක් සකස් කර නොතිබුණි.

(ඇ) නිර්නායක අනුව ද්‍රව්‍ය ආධාර ලැබිය යුතු ආයතන හා පුද්ගලයින් හඳුනාගෙන නොතිබුණි.

(ඈ) ද්‍රව්‍ය බෙදා දීම පිළිබඳ විස්තර නොතිබුණි.

2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා
---------------------------------

(අ) අනියම් හා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබූ සේවකයින් 46 දෙනෙකු මාස 06 සිට වසර 04 දක්වා සේවයේ යොදවා තිබුණද, සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායක මුදල් ගෙවීමට කටයුතු කර නොතිබූ අතර, 2012 වර්ෂය සඳහා පමණක් එකතුව රු. 532,945 ක් වූ සේවක අර්ථසාධක අරමුදල් හා රු. 79,942 ක් වූ සේවක භාරකාර අරමුදල් ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 386(6) විධිවිධානයට පටහැනිව අවස්ථා 24 කදී වැටුප් ණය අත්තිකාරම් වෙනුවෙන් රු. 1,821,145 ක් වටිනාකමැති විවෘත චෙක්පත් නිකුත් කර තිබුණි.

3. පද්ධති හා පාලන
---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) මූල්‍ය පාලනය

(ඈ) ආදායම් පරිපාලනය